අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/01/12/06/05/01

ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2020.07. 07

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
පරිවේණාධිපතිවරුන්,
විදුහල්පතිවරුන් වෙත,

**Covid -19 වසංගතය හේතුවෙන් නිවාඩු ලබා දුන් රජයේ පාසල් හා රජය අනුමත පෞද්ගලික පාසල් නැවත ආරම්භ කිරීමේ ක්‍රියාවලිය - අධ්‍යයන කාර්යය මණ්ඩලවල පැමිණීම හා පිටවීම**

Covid -19 වසංගතය හේතුවෙන් නිවාඩු ලබා දුන් රජයේ පාසල් හා රජය අනුමත පෞද්ගලික පාසල් නැවත ආරම්භ කිරීමේ ක්‍රියාවලියට අදාළ ව ඉහත සමාංකිත හා 2020.06.10 හා 2020.06.22 දිනැති ලිපිවලට වැඩිමනත් වශයෙනි.

මෙම වසංගත තත්ත්වය හමුවේ පාසල් ආරම්භ කිරීමේ පළමු හා දෙවන අදියරවල (ජූලි 06 - ජූලි 17 දක්වා), (ජූලි 20 -ජූලි 24 දක්වා) දී පාසල තුළ පිරිස් ඒකරාශී වීම අවම කර ගැනීමේ අරමුණින් පාසල් වෙත ගෙන්වා යුතු වන්නේ, පන්ති කාලසටහන් ලබා දී ඇති සහ වෙනත් කළමනාකරණ, පරිපාලන, විනය හා සෞඛ්‍ය කටයුතු ආදී වශයෙන් වගකීම් පවරා ඇති ගුරුවරුන් වේ. ඒ සඳහා පහත ක්‍රියාවලිය අනුගමනය කළ යුතු ය.

I. කිසිදු රාජකාරියක් නොපවරවන ලද සහ ඉගැන්වීම් කාල සටහන් නොමැති ගුරුවරුන් එම අදියරවල දී පාසලට ගෙන්වා ගැනීම සිදු නොකළ යුතු යි. එසේ ම, වගකීම් පවරන ලද ගුරුවරුන් පෙ.ව. 7.30 වන විට සේවයට වාර්තා කළ යුතු වන අතර, තම නියමිත රාජකාරී නිම කිරීමෙන් අනතුරු ව බැහැර යාමට අවස්ථාව ලබා දිය යුතු ය.

II. තෙවන අදියරේ (ජූලි 27 සිට) දී සියලු ම ගුරුවරුන් සුපුරුදු පරිදි පෙ.ව. 7.30 වන විට සේවයට වාර්තා කළ යුතු වන අතර ප.ව. 1.30 දක්වා පාසලේ රැඳී සිටිය යුතු ය. එමෙන් ම, ප.ව. 3.30 දක්වා කාලසටහන් ලබා දී ඇති ගුරුවරුන් එම කාල සීමාව දක්වා පාසලේ රැඳී සිටිය යුතු ය.

III. තෙවන අදියරේ (ජූලි 27 සිට) සේවයට වාර්තා කරන සියලු ම අධ්‍යයන කාර්ය මණ්ඩලවල නිලධාරීන් විසින් පොදු 18 වන ආකෘති පත්‍රයේ දක්වා ඇති ලේඛනයේ සුපුරුදු පරිදි පැමිණීම හා පිටවීම අත්සන් කළ යුතු ය.

ඉහත උපදෙස් අනුගමනය කිරීමට සියලු ම පාර්ශ්ව වගබලා ගත යුතු ය.

එන්.එච්.එම්.චිත්‍රානන්ද
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister } +94112784832 / +94112784825 / minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary } +94112784811 / +94112785162 / secretary.education@moe.gov.lk